කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

**පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය**
**உரஉற்பத்தி மற்றும் வழங்கல்கள், இரசாயன உரங்கள் மற்றும் கிருமிநாசினி பாவனை ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சு**
**State Ministry of Production and Supply of Fertilizer and Regulation of Chemical Fertilizer and Insecticide Use**

නො. 80/5,ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
இல.80/5, கொவி ஜன மந்திரய, ரஜமல்வத்த ஒழுங்கை, பத்தரமுல்லை
No. 80/5, Govijana Mandiraya, Rajamalwatta Avenue, Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. எனது இல. My No. | 7/1/3/2020-21මහ/චක්‍රලේඛ | ඔබේ අංකය. உமது இல. Your No. | | දිනය. திகதி. Date. | 2020.09. 14 |

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්,

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

සභාපති, ලංකා පොහොර සමාගම,
සභාපති, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,

**2020 / 21 මහ කන්නයේ වී ගොවිතැන සඳහා නොමිලේ පොහොර බෙදා හැරීම**

වී ගොවීන් වෙත නොමිලේ පොහොර ලබා දීමේ වැඩසටහන 2020 / 21 මහ කන්නයේදී ද ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. මෙම වැඩසටහන යටතේ වී ගොවිතැන සඳහා යූරියා, ත්‍රිත්ව සුපිරි පොස්පේට් (ටී.එස්.පී) හා මියුරියේට් ඔෆ් පොටෑෂ් (එම්.ඕ.පී.) පොහොර නිර්දේශයට අනුව නොමිලේ වී ගොවීන් වෙත සැපයීමට කටයුතු කරනු ලැබේ.
2020 / 21 මහ කන්නයේ දී වී වගාව සඳහා නොමිලේ පොහොර බෙදාහැරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හා උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ අඩංගු ***නොමිලේ පොහොර බෙදාහැරීමේ චක්‍රලේඛ 6 / 2020*** මෙයට යා කර ඇත. එහි සඳහන් ක්‍රමවේදය, උපදෙස්, සීමාවන් හා කොන්දේසි මැනවින් අවබෝධ කර ගන්නා ලෙසත්, 2020 / 21 මහ කන්නය ආරම්භ වීමට පෙර අවශ්‍ය දැනුවත්භාවය අදාළ සියලු නිලධාරීන්ට ලබා දීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.
පොහොර සපයා ගැනීමේදී හා බෙදාහැරීමේදී ප්‍රමාදයන් හා දුෂ්කරතාවයන් වළක්වා ගැනීම සඳහා හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ගබඩාවේදී අවශ්‍ය පොහොර නොමිලේ ලබාදීම තහවුරු කිරීම පිණිස පොහොර බෙදාහැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු පාර්ශවයන් මනා අවබෝධයකින් හා සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාමාර්ග ගැනීම අත්‍යාවශ්‍ය වේ.
තවද, මේ වන විට රජය විසින් ආරම්භ කර ඇති පරිසර හිතකාමී පොහොර නොමිලේ ලබා දීමේ ව්‍යාපෘතියට අනුව රසායනික පොහොර භාවිතය අඩුකිරීමට හා පරිසර හිතකාමී පොහොර භාවිතය ඉහල නැංවීම සඳහා ඉහලම ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.
රජය විශාල මූල්‍ය දායකත්වයක් සලසමින් ක්‍රියාත්මක කරන පොහොර සහනාධාර වැඩසටහන මඟින් අපේක්ෂා කරන කෘෂිකාර්මික හා ආර්ථික සංවර්ධන අරමුණු සඵල කර ගැනීමට මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීමෙන් ඔබගෙන් ලැබෙන දායකත්වය බෙහෙවින් අගය කරමි.

එම්.එන්.රණසිංහ
රාජ්‍ය ලේකම්
පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා
කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පිටපත් සඳහා කරුණාකර අනෙක් පිට බලන්න

ලේකම් செயலாளர் Secretary — දුරකථන தொலைபேசி Telephone - 011-2879048; ඊ-මේල් மின்னஞ்சல் e- mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් தொலைநகல் Fax - 011-2863497
කාර්යාලය அலுவலகம் Office — දුරකථන தொலைபேசி Telephone - 011-2872093, 011-2872097; ඊ-මේල් மின்னஞ்சல் e- mail - info@agrimin.gov.lk; ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910